# රනිල්ගේ උපාසකකම

රනිල් වික්‍රමසිංහ මහතා සැදැහැති උපාසකයකු ලෙස පෙනී සිටීමට වෑයම්කරනු පෙනෙයි. කලකට පෙර සර්වජන ඡන්දය ලැබුණු මුල් යුගයෙහි දී මෙරට ඩොනමෝර් බෞද්ධයන් නමින් පිරිසක් ඇතිවූහ. එතෙක් ක්‍රිස්තියානි, විශේෂයෙන් ම ඇංග්ලිකන් ක්‍රිස්තියානි, වී සිටි ඇතැම්හු ඩොනමෝර් යෝජනාවල ප්‍රතිඵලයක් ලෙස 1931 පැවති රාජ්‍ය මණ්ත්‍රණ සභා මැතිවරණයට පෙර සිට ම බෞද්ධ වී සිටියහ. හුළං හමන්නේ කිනම් දිශාවකට දැයි දැන සිටි මේ පිරිස බෞද්ධ බහුතරයෙහි ඡන්දය ගැනීම්වස් එසේ ආගම මාරුකළහ. බ්‍රිතානි යටත්විජිත යුගයෙහි දී ස්වදේශිකයන් අතර යම් බලයක් ඉසිළූ අයගෙන් ඉතා විශාල ප්‍රමාණයක් ඇංග්ලිකන් ක්‍රිස්තියානි භක්තිකයෝ වූහ. සර්වජන ඡන්දයෙන් පසු තමන්ට බලය නැති වී යා හැකි යැයි සිතූ මේ අයගෙන් ඇතැම්හු බෞද්ධ වී හෝ තම බලය ආරක්ෂා කරගැනීමට ඉටාගත්හ. එහි ප්‍රතිඵලය වූයේ ඩොනමෝර් බෞද්ධයන් නමින් හැඳින්වෙන පිරිසක් මෙරට ඇතිවීම ය. මේ ඩොනමෝර් බෞද්ධයන්, සංස්කෘතියෙන් ක්‍රිස්තියානි වූ එහෙත් ආගමෙන් බෞද්ධ වූ ඕල්කට් බෞද්ධයන්ගේම කොටසක්, උපකුලකයක් ලෙස ද සැලකිය හැකි ය. ඕල්කට් බෞද්ධයන් අතර ඩොනමෝර් බෞද්ධයන්ට අමතරව වෙනත් අයද සිටි බව අමතක නොකළ යුතු ය.

රනිල් වික්‍රමසිංහ මහතාගේ පියා ඇංග්ලිකන් ක්‍රිස්තියානි වෙයි. ඔහුගේ මව බෞද්ධ ය. එහෙත් පිය පාර්ශ්වය බෞද්ධ නො වෙයි. ඔහුගේ බාප්පා ඇංග්ලිකන් ක්‍රිස්තියානි පූජකයකු වූ අතර, කලක් ඒ සභාවෙහි ප්‍රධානියා ද විය. ඔහුගේ නැන්දනියක හා විවාහ වූ පුද්ගලයාගේ දෙමව්පියන් බෞද්ධ නමුත් ඒ පුද්ගලයා ඇංග්ලිකන් ක්‍රිස්තියානි විය. රනිල් වික්‍රමසිංහ මහතා මෑතක් වන තුරුම බෞද්ධ උපාසකයකු ලෙස නම් දරා නො සිටියේ ය. සිරිකොත මන්දිරයේ බුදු පිළිම වහන්සේ නමක් ඉවත්කර තිබුණේ වික්‍රමසිංහ මහතාගේ අවශ්‍යතාවට යැයි කියැවෙයි. එ ජා පක්ෂයේ ඇතැම් මණ්ඩලවල රැස්වීම් ආරම්භයේ දී පන්සිල් ගැනීම වික්‍රමසිංහ මහතා තහනම් කර තිබුණි යැයි කියැවෙයි. වෙසක් උත්සවයට වඩා ඉහළින් සිටින සේ නත්තල සමරනු ලැබුවේ වික්‍රමසිංහ මහතා ද සාමාජිකයකු වූ එ ජා ප ආන්ඩුවකින් ය. මෙරටට යටත්විජිතවාදී පෘතුගීසීන් පැමිණ අවුරුදු පන්සීයක් පිරීම සැමරීම සඳහා කටයුතු කෙළේ ද වික්‍රමසිංහ මහතා ය. පෘතුගීසීන් මෙරට බෞද්ධ සිද්ධස්ථාන නැතිකළ බවත්, ඒ සමතලා කළ බවත්, වික්‍රමසිංහ මහතා නොදන්නේ යැයි නොසිතිය හැකි ය. කැලණි විහාරයෙහි ප්‍රධාන දායකයකු වූ ඒ මහතා පෘතුගීසීන් ඒ විහාරයට සැලකූ ආකාරය දැනගත යුතු ය. එහෙත් 2005 දී පෘතුගීසීන් පැමිණීමේ පන්සියවස සැමරීම පිළිබඳ සාකච්ඡා සඳහා එකල රනිල් වික්‍රමසිංහ මහතා පෘතුගාලයට ද ගියේ ය. යම්කිසි ආකාරයකින් මේ වසරේ එ ජා ප ආණ්ඩුවක් තිබිණි නම් රනිල් වික්‍රමසිංහ මහතා මහාබෝධි සංගායනා කතා වෙනුවට පෘතුගීසි සාජ්ජ පැවැත්වීමට ඉඩ තිබුණි.

වික්‍රමසිංහ මහතා හදිසියේ වෙනස් වී ද? එසේත් නැත්නම් ඒ මහතා බටහිර උපදේශකවරුන්ගේ යෝජනාවක් පරිදි ඩොනමෝර් බෞද්ධ චරිතයක් රඟපාන්නේ ද? අපට තේරුම් යන්නේ දෙවැන්න නිවැරදි බව ය. රනිල් වික්‍රමසිංහ මහතාට බෞද්ධෝපාසක චරිතයක් රඟපාන ලෙස යම්කිසි පුද්ගලයකුගෙන් හෝ පුද්ගලයන් පිරිසකගෙන් හෝ උපදෙස් ලැබී තිබෙන බවත් ඒ උපදෙස් අනුව තම ජනාධිපතිවරණ වැඩපිළිවෙල සකස්කරගන්නා බවත් පැහැදිලි ය. එහෙත් අවාසනාවකට රනිල් වික්‍රමසිංහ මහතාට ඒ සම්බන්ධයෙන් පැහැදිලි අදහසක් නැත. ඔහු ඡන්දකතා කිහිපයක් ම අනාගත් බව අද වන විට බොහෝ දනන් තුඩ තුඩ පවතියි. රනිල් වික්‍රමසිංහ මහතාට කතා ලිවීමට තරම් උගත් පිරිසක් එ ජා පක්ෂයේ නොමැති බව පැහැදිලි ය. ඉතිහාසය ගැන එතරම් උනන්දුවක් නොදැක්වූ පක්ෂයකට හා ඉතිහාසය නොදන්නා නායකයකුට හිටි අඩියේ ජනතාවට ඉතිහාසය ඉගැන්විය නො හැකි ය.

ඒ කෙසේ වෙතත් රනිල් වික්‍රමසිංහ මහතා බෞද්ධෝපාසක චරිතයක් රඟපාන්නේ ඇති ද යන්න පැහැදිලි ය. ඔහුට දෙමළ ඡන්දවලින් විශාල ප්‍රතිශතයක් ලැබීමට ඉඩ ඇත. කොටි සංවිධානය ඔහු වෙනුවෙන් දැනටමත් ඡන්ද ව්‍යාපාරය අරඹා ඇත. ආරුමුගම් තොණ්ඩමන් මහතා ද කවුරුත් දන්නා හේතු නිසා එ ජා පක්ෂයට සහයෝගය දෙයි. එහෙත් මුස්ලිම් ඡන්ද වැඩි ප්‍රමාණයක් මහින්ද රාජපක්ෂ මහතාට ලැබෙන බව නියත ය. මුස්ලිම් ව්‍යාපාරිකයන් රනිල් වික්‍රමසිංහ මහතාට ඡන්දය දුන්න ද සාමාන්‍ය මුස්ලිම් ජනයාට වඩා සමීප රාජපක්ෂ මහතා ය. ඒ කුමක් වුවත් අද වන විට මෙරට ජනයාගෙන් සියයට අසූවකට ආසන්න පිරිසක් සිංහලයෝ ය. සති අන්ත පත්තර කඩමාල්ලක සිංහල බෞද්ධ විරෝධී කතෘ බොරු ගණන් හිලවු ඉදිරිපත් කරමින් මහින්ද රාජපක්ෂ මහතාට ජයග්‍රහණය කළ නොහැකි යැයි

© Prof. Nalin De Silva

බෙරිහන් දුන්න ද, නාම යෝජනා පත්‍ර දෙන දිනයේ දී ප්‍රංශයට රිංගාගත් චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය වැනි විජාතික බලවේගයෙහි නියෝජිතවරියක ශ්‍රී ල නි පක්ෂයට ඊනියා සුළුජාතික ඡන්ද නැතිව දිනන්නට බැරි යැයි කෑමොර ගැසුව ද, 1999න් පසුව මෙරට ඡන්දයෙහි තීරණාත්මක බලය බවට නැවතත් සිංහලයන් පත් වී ඇති බව කාහටත් වඩා හොඳින් බටහිර විශ්ලේශකයෝ දනිති. අද ටැමිල් යුනියන් ක්‍රීඩා සමාජය වෙනුවෙන් ක්‍රීඩා කිරීමට ද සිංහලයන් යොදාගැනීමට සිදු වී තිබීමෙන් වුව ද පෙන්නුම් කරන්නේ මෙරට දෙමල ජන අනුපාතය පසුගිය දශක දෙකක කාලයෙහි සීඝ්‍රයෙන් අඩු වී ඇති බව ය. 1994 ජනාධිපතිවරණයෙහි දී චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියට සියයට හැටදෙකක පමණ ඡන්ද ප්‍රතිශතයක් ලැබුණේ දෙමළ ඡන්ද ද විශාල ප්‍රමාණයක් ඇයට ලැබුණු බැවින් ය. එහෙත් 1999 දී ඇය සියයට පනස්එකක ඡන්ද ප්‍රතිශතයක් ලබාගත්තේ දෙමළ ඡන්ද නැතිව ය. 1999 දී ඇයත් ඉන්පසු සන්ධානයත් මැතිවරණවලින් ජයගත්තේ සිංහල ඡන්දවලින් යැයි කීම අතිශයෝක්තියක් නො වෙයි. සියයට අසූවක් පමණ වූ සිංහල ඡන්දවලින් සියයට හැටක් පමණ ලබන පක්ෂය අද මැතිවරණයක දී ගෙ       ) ජනාධිපතිවරණයක දී හෝ ජයගනියි. වෙනත් වචනවලින් කියන්නේ නම් සිංහල පාවෙන ඡන්ද ලබන්නා අද ජයග්‍රහකයා වෙයි. මහින්ද රාජපක්ෂ මහතාට සිංහල ඡන්දවලින් සියයට හැටකට වඩා ලැබෙන බව පැහැදිලි හෙයින් අද රනිල් වික්‍රමසිංහ මහතාගේ ජනාධිපතිවරණ ව්‍යාපාරයෙහි දී වැදගත් තැනක් හිමි වී ඇත්තේ හැකිනම් මේ ඡන්ද ප්‍රමාණය අඩුකිරීමට ය.

සිංහල ඡන්දවලින් විශේෂයෙන් සිංහල බෞද්ධ ඡන්දවලින් සියයට හතළිහකට වඩා නොගෙන රනිල් වික්‍රමසිංහ මහතාට ජයගත නො හැකි ය. අද හදිසියේ රනිල් වික්‍රමසිංහ මහතා උපාසකයකු වී ඇත්තේ එබැවින් ය. එහෙත් ඒ මහතාගේ අවාසනාවකට සාමාන්‍ය ව්‍යවහාරයේ ඇති යෙදුමක් යොදාගන්නේ නම්  ඔහුගේ ඇගේ උපාසකකමක් තබා බෞද්ධකමක්වත් නැත. එබැවින් ඔහුට බෞද්ධකම ආරූඪකරගැනීමට සිදු වී ඇත. එහෙත් ඉන් ඔහුගේ ජනාධිපතිවරණ ව්‍යාපාරයට සිදුවන්නේ හානියකි. දැනටමත් ඉතිහාසය හා සංස්කෘතිය ගැන කතාකිරීමට ගොස් ඔහු අමාරුවේ වැටී ඇත. යමකුට රබන් ගැසීමට තැත්කළ පමණින්, පැරකුම් යුගයක් ගැන කතා කළ පමණින්, ලෝකයේ විශාලම චෛත්‍යය ඉදිකිරීමට කතාකළ පමණින්, බුද්ධගයාවේ නොපැවැත් වූ සංගායනා ගැන කතාකළ පමණින්, සිංහල බෞද්ධ සංස්කෘතියට ඇතුල්විය හැකි නො වෙයි. තමන් නොදන්නා දේ අනෙක් අයග උපදෙස් මත කිරීමට ගොස් සිංහල ඡන්දවලට අමතරව දෙමළ ඡන්ද ද නැතිකරගැනීමට වික්‍රමසිංහ මහතා කටයුතු කරයි. යුරෝපා සංගමයේ බොරු තහනමක් ඉවත්කරගන්නා බවට තිස්ස අතාතනායක මහතා දෙමළ පුවත්පතකට ප්‍රකාශකිරීමෙන් දෙමළ ඡන්ද ලබාගැනීමට ද එ ජා පක්ෂයට මහන්සි වීමට සිදුවන බව එක් පැත්තකින් පෙනී යයි.

යුරෝපා සංගමයේ ව්‍යාජ තහනම ගැන ද කෙටියෙන් හෝ සඳහන්කළ යුතු වෙයි. යුරෝපා සංගමය යන ආයතනය ම ව්‍යාජයකි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ඇග්ලිකන් සංස්කෘතියට උඩින් යෑමට උත්සාහකරන්නන්ට බාධාකරයි. ලංකාවේ පමණක් නොව යුරෝපයේ ද තත්ත්වය එබඳු ය. යුරෝපා සංගමයට බ්‍රිතානිය හා ඇ ඒ ජනපදය එතරම් කැමැත්තක් නො දක්වයි. තවමත් පොදු කාසිය වූ යූරෝව හැරෙන්නට වෙනත් පොදු බවක් යුරෝපා සංගමයේ නැත. යුරෝපා සංගමයට වර්ධනය විය හැක්කේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය පරාජය කරමින් ය. ඒ සඳහා යුරෝපයට ශක්තියක් ඇතැයි සිතිය නොහැක්කේ ඒ රටවල ද දැනුම අවසාන වශයෙන් ගත්කල යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි නිපදවෙන්නක් වී තිබීම ය. ඒ කුමක් වුවත් යුරෝපා සංගමය කර ඇත්තේ ඒ රටවල රාජ්‍ය විසින් කොටි සංවිධානයේ නියෝජිතයන් පිළිගනු නොලැබීමට කටයුතු කිරීම ය. එහෙත් කොටි සාමාජිකයන්ට පුද්ගලයන් ලෙස යුරෝපයේ ජීවත්වීම හෝ සංචාරයකිරීම හෝ ඉන් තහනම් නො වෙයි. එමෙන් ම ඒ රටවල රාජ්‍ය නියෝජිතයන්ට ලංකාවේ දී හෝ වෙනත් යුරෝපීය නොවන රටක දී හෝ කොටි නියෝජිතයන් මුණගැසීමට ද බාධාවක් නො වෙයි. තිස්ස අත්තනායක මහතා අමාරුවේ වැටී ඇත්තේ ව්‍යාජ යුරෝපා සංගමයේ ව්‍යාජ තහනමක් අස්කරගන්නා බවට ප්‍රතිඥා දීමට ගොස් ය. විජාතික බලවේගවල සෘජු නියෝජිතයා ලෙස එ ජා පක්ෂය මූලික වශයෙන් ඇංග්ලිකන් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ආරක්ෂකයා වෙයි. එ ජා පක්ෂයේ සැඟවී තිබූ ඇංග්ලිකන් ක්‍රිස්තියානි සංස්කෘතිය ඉදිරියට පැමිණියේ ජේ ආර් ජයවර්ධන මහතාගෙන් පසුව ය. වික්‍රමසිංහ මහතාගේ ප්‍රතිපත්ති ජයවර්ධන මහතාගේ ප්‍රතිපත්තිවලින් වෙනස් නො වෙයි. එහෙත් ඡන්දය සඳහා වික්‍රමසිංහ මහතාට සිල් රෙදි පෙරවීමට සිදු වී ඇත. සිල් රෙද්දට විරුද්ධවීමට පුරුදුකරවා ඇති දෙමළ ජනයා එ ජා ප - කොටි - බ්‍රිතානි - නෝර්වේ ව්‍යාපෘතියේ ම රඳවාගැනීමට අත්තනායක මහතා කරන ප්‍රකාශවලින් සිල් රෙදි ගැලවී පා නොවී එතැනම වැටෙන්නේ සුළඟ එනු පිණිස ද නොඑන බැවින් ය.

© Prof. Nalin De Silva